# Abstract No 77

## මුල් බුදුදහම හා මාධ්‍යමික සම්ප්‍රදාය අතර ඇති සබඳතාව පිළිබඳ අධ්‍යයනයක්

**ආර්.එම්.සී.පී.රත්නායක**
සහකාර කථිකාචාර්ය,පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණු විශ්වවිද්‍යාලය.
prasanthirathnayaka@gmail.com,

මුල් බුදුසමය යනු බුදුන්වහන්සේ විසින් දේශනා කරන ලද මූලික ධර්ම දේශනාවන්හි අන්තර්ගත ධර්ම කරුණු ය. මාධ්‍යමික සම්ප්‍රදාය යනු එක් මහායාන ගුරු කුලයකි. මහායාන සම්ප්‍රදාය දාර්ශනික සිද්ධාන්තයන්ගෙන් සංවර්ධනය කළ එක් ප්‍රධාන සම්ප්‍රදායක් ලෙස මාධ්‍යමික සම්ප්‍රදාය හඳුනාගත හැකි ය. එහි ප්‍රභවය නාමික ව සිව්වන සංගීතියෙන් පසු ව සිදු වූ නමුදු දීර්ඝකාලයක් තිස්සේ සංවර්ධනය වෙමින්, විකාශනය වෙමින් පැවැති ශාසනික හා දාර්ශනික හේතු සාදක එකී සම්ප්‍රදායේ බිහි වීම සඳහා මූල සාදක සපයා ඇත. ශූන්‍යතාවාදයත්, සාපේක්ෂතාවාදයත් ඉදිරිපත් කළ මාධ්‍යමිකයන් පසුකාලීන චින්තන ඉතිහාසයේ උපන් අතිසූක්ෂ්ම ගැඹුරු තර්කවාදීන්ගෙන් අග තැන්පත් සුප්‍රකට මහායාන ගුරුකුලයකි. මෙහි ආදී කර්තෘවරයා නාගාර්ජුනපාදයෝ ය. මාධ්‍යමික දර්ශනය ගොඩනැඟීම සඳහා මුල් බුදුදහමේ එන ඉගැන්වීම් යොදාගෙන ඇති බව පැවසේ. මුල් බුදුසමයේ දක්නට ඇති ආකාරයට ම මධ්‍යම ප්‍රතිපදාව ඉදිරිපත් කිරීමේ දී ශාස්වත උච්ඡේද හා අස්ති නාස්ති යනාදි වශයෙන් සියලු අන්තයන් බැහැර කළ ආකාරයෙන් ම ශූන්‍යයතාව ඉදිරිපත් කිරීමේ දී ද එබඳු අන්ත සියල්ල ප්‍රතික්ෂේප කර තිබේ. ලොව කිසිවක් තනි ව නොපවතින බවත් එක්දෙයක් පවතින්නේ අනෙකකට සාපේක්ෂ ව බවත් මාධ්‍යමිකයන් උගන්වා ඇත. මධ්‍ය මාර්ගයක් අනුගමනය කරන හෙයින් ද මොවුන් හැඳින්වීම සඳහා මාධ්‍යමික යන නම භාවිත කර ඇත. ලෝකය පිළිබඳ ව කථා කරන සත්-අසත්වාදයන් අනන්තය. ඇත නැත යන අන්තද්වයෙහි සත්‍යතාව නම් අන්ත දෙක ප්‍රතීත්‍ය සමුප්පන්න බව යි.ශූන්‍ය යනු ඇත යන්න හෝ නැත යන්න ද නොවේ. එහි ඇත්තේ සාපේක්ෂ අර්ථය යි. මාධ්‍යමිකයන් විසින් විරුද්ධවාදී මත දෙකක් අතර පවතින ගැටලුව විසඳීම සඳහා අපෝහවාදය ඉදිරිපත් කර ඇත. එසේ හඳුන්වන්නේ ඔවුන් සියල්ල මත ප්‍රතික්ෂේප කරන නිසා ය. අපෝහවාදය මුලින් ම ඉදිරිපත් කර ඇත්තේ බුදුරජාණන්වහන්සේ ය. මුල් බුදුසමයට අනුව යථාර්ථය, යථා ස්වභාවය සදාකාලික වූවක් නොවිය හැකි ය. නියම ස්වභාවය වන්නේ ක්ෂණිකත්වය යි. ශූන්‍යතාව වනාහි නිර්වාණගාමී මාර්ගය ලෙස මහායානයේ සැලකෙයි. මුල් බුදුසමයේ ද ඊට සමාන අදහස් දක්නට ලැබේ. එහි දැක්වෙන පරිදි අසංඛතගාමී මාර්ගය නිර්වාණය ලබාගැනීමේ මාර්ගය වේ. මෙසේ මාධ්‍යමික සම්ප්‍රදායේ ප්‍රභවය සඳහා ප්‍රධාන වශයෙන් මුල් බුදුසමයේ එන ඉගැන්වීම් පදනම් ව ඇති අයුරු ථෙරවාද හා මහායාන මූලාශ්‍රය අධ්‍යයනය ඇසුරින් සනාථ කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් සිදුකෙරේ.

**ප්‍රමුඛ පදඃ** මාධ්‍යමික සම්ප්‍රදාය, ශූන්‍යතාව, මුල් බුදුසමය, සාපේක්ෂතාව, අපෝහවාදය